# ශ්‍රී ලංකාවේ පුරාවස්තු ආඥා පනත හා එහි ක්‍රියාකාරීත්වය

ආර්.එම්.එච්.එල්. රත්නායක

පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

---

ශ්‍රී ලංකාවේ පුරාවස්තු සම්බන්ධ ආඥා පනත්වල ඉතිහාසය ඉකුත් දශකය ආරම්භය දක්වා ඈතට දිව යයි. 1888 වර්ෂයේදී නිදන් වස්තු ආඥා පනත පුරාවස්තු හා සබැඳෙන්නකි. ඉන් අනතුරු ව 1900, 1940, 1956, 1988 සහ 2005 යන වර්ෂවලදී නව පනත් සහ සංශෝධනයන් හරහා පුරාවිද්‍යා පනත් බිහිවී තිබේ. එම පනත් අතරින් විශේෂිත සහ භාවිතයෙහි පවතින 1940 පුරාවිද්‍යා ආඥා පනතෙහි ක්‍රියාකාරීත්වය විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

පුරාවස්තු වාස්තු විද්‍යාත්මක ව්‍යූහයක් පමණක් නොව සමස්ත පුරාවිද්‍යා උරුමය සම්බන්ධයෙන් මූලික නෛතික පදනමක් දරණ 1940 පුරාවස්තු ආඥා පනත මූලික කොටස් 8 කින් හා වගන්ති 49 කින් සමන්විතය. මෙම ප්‍රඥප්තියේ පුරාවස්තුවල අයිතිය, පුරාවස්තු සොයා ගැනීම් හා කැණීම්, පැරණි ස්මාරක, වෙන්කළ පුරාවිද්‍යා ප්‍රදේශ, පුරාවස්තු අපනයනය, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ බලතල හා කාර්යයන් පිළිබඳව හා වෙනත් කරුණු සම්බන්ධව යම් යම් ප්‍රතිපාදන හා විධිවිධාන අන්තර්ගතය. ඒ අනුව මෙම ප්‍රඥප්තිය මගින් ශ්‍රී ලංකාවේ පුරාවස්තු, ස්මාරක හා ක්ෂේත්‍ර ආරක්ෂාකිරීම සම්බන්ධ මූලික නෛතික පදනම ඉදිරිපත්කර තිබේ. එහෙත් මෙතරම් නීතිමය ප්‍රතිපාදන සලසා තිබුණත් ආයතනික ව්‍යුහය හා නිලධාරී ක්‍රියාකාරීත්වය, දේශපාලන මැදිහත්වීම්, නීතිය ක්‍රියාත්මකවීම ආදිය සම්බන්ධව විවිධ ගැටළු පවතී. මෙම අධ්‍යයනයේදී පුරාවිද්‍යා ආඥා පනතෙහි වන විධිවිධාන නැවත සලකා බලන අතර එහි දුර්වලතා හා සාධනීය ලක්ෂණ පුනර්විචේනයට ලක් කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම එහි වන ඇතැම් දුර්වලතා හා පුරාවස්තු විනාශ කරන්නන් ඒවායෙන් ප්‍රයෝජන ගනු ලබන ආකාරය සාකච්ඡා කිරීමට ද අපේක්ෂා කෙරේ. තව ද තත්කාලීන සමාජ සන්දර්භයෙහි පුරාවස්තු ආඥා පනතේ භාවිත ස්වරූපයන් ද අවධානයට ලක්කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : පුරාවස්තු ආඥා පනත, ශ්‍රී ලංකාව, ආයතනික ව්‍යුහය